# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1589/ 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 18/12/2023<br>පැය 1505 |

## මාධ්‍ය නිවේදනය

### විෂ මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා දිවයින පුරා ක්‍රියාත්මක විශේෂ මෙහෙයුම සම්බන්ධ වාර්තාව.

විෂ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හා බෙදා හරින්නන්ගේ ජාලයන් මර්ධනය කර ඔවුන් අත්අඩංගුවට ගැනීම සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි 2023.12.17 වන දින සිට 2023.12.23 වන දින දක්වා විශේෂ මෙහෙයුම් ආරම්භ කෙරිණි.

එයට සමගාමීව 2023.12.17 වන දිනය තුල සිදු කරන ලද මුළු වැටලීම් 2159 කට අදාලව සැකකරුවන් 2020 ක් සහ සැකකාරියන් 101 ක් අත්අඩංගුවට ගෙන ඇත. ඉන් සැකකරුවන් 12 ක් වැඩිදුර විමර්ශන සඳහා රඳවා තබා ගැනීමේ නියෝග ලබා ගැනීමට නියමිතව ඇති අතර සැකකරුවන් 05 දෙනෙකුගේ වත්කම් සම්බන්ධයෙන් විමර්ශන ආරම්භ කිරීමට නියමිතය. තවද සැකකරුවන් 133 දෙනෙකු පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි.

**මෙම මෙහෙයුමේදී බස්නාහිර පළාත ආවරණය වන පරිදි සිදු කරන ලද මත්ද්‍රව්‍ය වැටලීමේදී හෙරොයින් කිලෝග්‍රෑම් 01 ග්‍රෑම් 415 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 500 ක්, ගංජා කිලෝ ග්‍රෑම් 02 ග්‍රෑම් 778 ක්, හැෂ් කිලෝ ග්‍රෑම් 35 ක් පොලිසිය භාරයට ගෙන ඇති අතර එම පළාත තුල සිදු කල මුළු වැටලීම් 907 කදී සැකකරුවන් 859 ක් හා සැකකාරියන් 47 ක් අත්අඩංගුවට ගෙන ඇත.**

**දකුණු පළාත ආවරණය වන පරිදි සිදු කරන ලද මත්ද්‍රව්‍ය වැටලීමේදී හෙරොයින් ග්‍රෑම් 135 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 ක්, ගංජා පැළ 38 ක් හා ගංජා ග්‍රෑම් 846 ක් ද පොලිසිය භාරයට ගෙන ඇති අතර එම පළාත තුල සිදු කල මුළු වැටලීම් 210 කදී සැකකරුවන් 197 ක් හා සැකකාරියන් 08 ක් අත්අඩංගුවට ගෙන ඇත.**

වැටලීමට අදාල විශේෂිත සංඛ්‍යා තොරතුරු පහත පරිදි සඳහන් කර ඇත.

| | | |
|---|---|---|
| 804 | වැටලීම් සංඛ්‍යාව | හෙරොයින් |
| 2232.826 | ප්‍රමාණය (g/mg) | |
| 415 | වැටලීම් සංඛ්‍යාව | අයිස් |
| 769.646 | ප්‍රමාණය (g/mg) | |
| 822 | වැටලීම් සංඛ්‍යාව | ගංජා |
| 178916.2 | ප්‍රමාණය (g/mg) | |
| 30550 | ගංජා පැළ | |
| 118 | වැටලීම් සංඛ්‍යාව | වෙනත් මත් ද්‍රව්‍ය |
| 36809.286 | ප්‍රමාණය (g/mg) | |
| 3489.2 | මත්පෙති (g/mg) | |
| 2159 | මුළු වැටලීම් ගණන | |
| 101 | ස්ත්‍රී | අත්අඩංගුවට ගත් මුළු සැකකරුවන් ගණන |
| 2020 | පුරුෂ | |
| 12 | රඳවා තබා ගැනීමේ නියෝග ලබා ගැනීමට නියමිත සැකකරුවන් ගණන | |
| 05 | වත්කම් විමර්ශන ආරම්භ කිරීමට අදහස් කරන සැකකරුවන් ගණන | |
| 133 | පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට අපේක්ෂිත පුද්ගලයින් ගණන | |

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**